මිහින්තලේ ප්‍රාදේශීය සභාව

අනුරාධපුර දිස්ත්‍රික්කය.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 අගෝස්තු 09 වන දින ද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 අප්‍රේල් 29 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 මතය

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති මිහින්තලේ ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී සභාව විසින් අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති අනාවරණය කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩු පාඩු

මූල්‍ය ප්‍රකාශනවල පැවති ගිණුම්කරණ අඩුපාඩු සහ එමගින් මූල්‍ය ප්‍රකාශනවලට සිදුවී ඇති බලපෑම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | අඩුපාඩුවේ ස්වභාවය | අවස්ථා ගණන | මූල්‍ය ප්‍රකාශනයන්ට බලපෑම | | | |
|---|---|---|---|---|---|---|
| | | | ආදායම් | වියදම් | වත්කම් | වගකීම් |
| | | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| (අ) | මූල්‍ය ප්‍රකාශන වලින් | | | | | |
| | අත්හැරීම් | 06 | - | - | 861 | - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | - එම- | 01 | - | - | - | 599 |
| | - එම- | 01 | - | 599 | - | - |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන වල අඩුවෙන් දැක්වීම් | 01 | 207 | - | - | - |
| | - එම- | 11 | - | 149 | - | - |
| | - එම- | 11 | - | - | - | 149 |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශනවල අනුචිත හෙළිදරව් කිරීම් | 01 | 60 | - | - | - |
| | - එම- | 01 | - | 24 | - | - |
| | - එම- | 04 | - | - | 04 | - |

1.3.3 නොසැසඳු ගිණුම්

ගිණුම් විෂයයන් 06 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.2,189,386 ක් වූ අතර, උපයෝගී ලේඛන හා වාර්තා අනුව එම ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.28,600,780 ක් විය.

1.3.4 පැහැදිලි නොකළ වෙනස්කම්

ප්‍රාදේශීය සභා ගිණුම් ක්‍රමය අනුව ඉඩම් හා ගොඩනැගිලි හැර ස්ථාවර වත්කම්වල එකතුව ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමෙහි ශේෂයට සමාන විය යුතු වුවත්, 2010 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම්වල වටිනාකම රු.4,691,459 ක් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමෙහි ශේෂය රු.7,616,283 ක් වුයෙන් ගිණුම් දෙක අතර රු.2,924,824 ක වෙනසක් අනාවරණය විය.

1.3.5 ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු පළාත් පාලන සේවක දායක මුදල් රු. 558,512 ක් ණය හිමියෝ යටතේ ගිණුම්ගත කර තිබුණු නමුත් දායක මුදල් ගෙවිය යුතු නිලධාරීන්ගේ විස්තර හා ප්‍රාදේශීය සභාවේ සේවය කළ කාලය තහවුරු කරගෙන නොතිබුණි.

1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම.

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.203,461 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.7 අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි, විධිවිධානවලට හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනතේ 154 වගන්තිය | මාසිකව රු.50,000 ක් හෝ වාර්ෂිකව රු.500,000 ක් ඉක්මවූ නිශ්චිත ගෙවීම් කිරීමේදී එම ගෙවීම් මත 5% ක රඳවා ගැනීමේ බද්දක් අය කර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු වුවත්, සභාවේ ඉහත සීමා ඉක්මවා කරන ලදරු.1,582,700 ක ගෙවීම් වලදී රඳවා ගැනීමේ බදු අය කර නොතිබුණි. |
| (ආ). | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i). | මුදල් රෙගුලාසි 237 (අ) සහ (ආ) | ගබඩා සැපයුම් සඳහා ගෙවීම් කිරීමේදී අදාල භාණ්ඩ ගිවිසුම් ප්‍රකාරව ගුණාත්මකතත්වයෙන් ගබඩාවට ලැබුණු බවටත්, තොග ලේඛණවල ඇතුළත් කළ බවටත් ගබඩා භාර නිලධාරියා විසින් අදාල ගෙවීම් වවුචරයේ සහතිකයක් දිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 06 කදී රු.91,668 ක් වටිනා භාණ්ඩ සඳහා ගෙවීම් කිරීමේදී මුදල් රෙගුලාසියට අනුව කටයුතු කර නොතිබුණි. |
| (ii). | මුදල් රෙගුලාසි 571 | තැන්පත් කළ දින සිට වර්ෂ 02 ක් ඉකුත් වූ රු.121,470 ක ආපසු නොගෙවූ තැන්පතු නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.999,695 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,585,230 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|---|
| | ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| (අ) | වරිපනම් හා බදු | - | - | - | - | - | - |
| (ආ) | බදුකුලී | 3,304 | 929 | 1,746 | 886 | 890 | 31 |
| (ඇ) | බලපත්‍ර ගාස්තු | 475 | 527 | - | 458 | 455 | - |
| (ඇ) | වෙනත් ආදායම් | 1,352 | 7 | 1,936 | 400 | 8 | 3,175 |

2.2.2 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අයකර පළාත් ආදායම් කොමසාරිස් වෙත එවා ඇති රු.782,304 ක දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

2.2.3 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු.395,413 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

2.2.4 වරිපනම් බදු

මිහින්තලේ ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ පිහිටි මිහින්තලේ ග්‍රාම නිලධාරී කොට්ඨාශය 1992 අගෝස්තු 05 දිනැති අංක 726/30 දරන ගැසට් පත්‍රය මගින් දියුණු කළ ප්‍රදේශයක් ලෙස නම්කර තිබුණු නමුත්, ප්‍රාදේශීය සභාව විසින් එකී ප්‍රදේශයේ පිහිටි වරිපනම් බදු අයකල හැකි දේපල වලින් වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් සභාවට ලැබිය යුතු ආදායම් අහිමි වී තිබුණි.

## 2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 අයවැය ගත | 2010 තථ්‍ය | 2010 විචලනය | 2009 අයවැයගත | 2009 තථ්‍ය | 2009 විචලනය |
|---|---|---|---|---|---|---|
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පුද්ගල පඩි | | | | | | |
| නඩි | 6,760 | 6,752 | 8 | 6,276 | 6,353 | (77) |
| අනෙකුත් | 4,300 | 4,233 | 67 | 4,508 | 3,803 | 705 |
| උප එකතුව | 11,060 | 10,985 | 75 | 10,784 | 10,156 | 628 |
| ප්‍රාග්ධන වියදම | 20,000 | 23,048 | (3,048) | 7,500 | 14,418 | (6,918) |
| මුළු එකතුව | 31,060 | 34,033 | (2,973) | 18,284 | 24,574 | (6,290) |

## 2.4 මානව සම්පත් කළමනාකරණය

### අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.

| | සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|---|
| (i) | මාණ්ඩලික | 01 | 01 |
| (ii) | ද්වීතියික | 10 | 08 |
| (iii) | ප්‍රාථමික | 13 | 13 |
| (iv) | වෙනත් (අනියම්/තාවකාලික) | - | 06 |
| | එකතුව | 24 | 28 |

2.5 වත්කම් කළමනාකරණය

2.5.1 නිශ්ක්‍රිය භෞතික සම්පත්

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මෝටර් රථ හා කරත්ත යටතේ දැක්වෙන රු.265,900 ක් වටිනා ආර්.කේ.80 අත් ට්‍රැක්ටරය හා ට්‍රේලරය අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගත හැකි නමුත් එසේ නොකිරීම නිසා නිෂ්කාර්යව පැවතුණි.

2.5.2 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.975,016 ක් වූ අතර අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ වටිනාකමු රු.975,016 ක් විය.

2.5.3 අයවීමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණු සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.1,220,158 ක් විය.

2.5.4 සමීක්ෂණය නොකළ වත්කම්

භෞතික පරීක්ෂණ/සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු නොවූ 2010 දෙසැම්බර් 31 දිනට පොත් අගය මත ගණන් බැලූ වත්කම් වල වටිනාකම රු.8,499,536 ක් විය.

2.6 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පළාත් පාලන කොමසාරිස්ගේ 2003 මාර්තු 24 දිනැති අංක එන්සීපී/එල්ජ්/18/4 දරන චක්‍රලේඛය ප්‍රකාරව විදේශීය වැඩමුළුවලට සහභාගීවීමේදී ඒ සඳහා පළාත් සභාවේ පූර්ව අනුමැතිය සහ පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය ඇතිව ගෙවීම් කළ යුතු වුවද, සභාපතිවරයාගේ තායිලන්ත සංචාරය සඳහා සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණු රු.70,000 ක මුදලක් සඳහා විගණිත දිනය වූ 2010 ජූලි 28 දින දක්වා කිසිදු අනුමැතියක් ලබා නොතිබුණි.

## 2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කෙරේ

(අ) සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට පැවති රු.30,750 ක හිඟ කඩකුලී ශේෂය කඩ කාමර හිමියන් විසින් අධිකරණයට ගෙවා ඇතත් එම මුදල් සභාවට අය කර ගැනීම සඳහා 2010 දෙසැම්බර් 31 වන විටත් පියවර ගෙන නොතිබුණි.

(ආ). 2010 පොසොන් උත්සවය සඳහා රු.221,981 ක් වටිනා ක්ෂේත්‍ර ගබඩා ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මිලගණන් කැඳවීමේදී පිරිවිතරයන් සඳහන් නොකර ඉල්ලුම් කරන භාණ්ඩයේ නම පමණක් සඳහන් කර තිබීම නිසා තරඟකාරී මිලගණන් ලබාගත නොහැකි වී තිබුණි.

(ඇ). සභාව බදුකරුවන් සමඟ අත්සන් කරන ලද ගිවිසුමේ 09 ජේදය ප්‍රකාර සභාවේ අවසරයකින් තොරව කිසිදු ඉදිකිරීමක් සිදු නොකළ යුතු වුවත් වෙළඳ කටයුතු සඳහා බදු දී තිබුණු සභාවට අයත් කඩ කාමර 22 ක අනවසර ඉදිකිරීම් සිදු කර තිබුනද ගිවිසුම් ප්‍රකාරව බදුකරුවන්ට එරෙහිව කටයුතු කර නොතිබුණි.බදුකරුවන් සමඟ අත්සන් කළ ගිවිසුමේ 22 ජේදය ප්‍රකාර කඩ කාමර හෝ ඉන් කොටසක් අතුරු බදු දීම සිදු නොකළ යුතු වුවත් කඩ කාමර අතුරු බදුදී තිබුණු අවස්ථා නිරීක්ෂණය විය.

## 2.8 කාර්ය සාධනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තිය ප්‍රකාර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ පහසුව, සුභ සාධනයට අදාල කාර්යයන් හා සෞඛ්‍ය, මංමාවත් හා පොදු උපයෝගී සේවාවන්ට අදාල කාර්යයන් ඉටු කිරීම සඳහා ඉදිරි වර්ෂවල ක්‍රියාකාරීත්වයට අදාල සැලසුම් ඇතුළත් සංයුක්ත සැලැස්මක් හා එම සැලැස්මේ සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාර්යයන් ඉටු කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

## 2.9 කොන්ත්‍රාත් පරිපාලනය

මිහින්තලේ බස් නැවතුම්පල ඉදිරිපිට ඉදිකිරීමට යෝජිතව තිබුණු ආර්ථික මධ්‍යස්ථාන ගොඩනැගිල්ල සඳහා සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයේදී රු.3,545,598 ක් වැයකර මධ්‍යස්ථානයේ බිම් මහලේ

කුළුණු බැද කොන්ක්‍රීට් තට්ටුව දමා ඉදිකිරීමේ කටයුතු නතර කර තිබීම නිසා අදාල ආර්ථික මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

3. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) ගබඩා පාලනය